**කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය සභාව**

**-----------------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කිනම් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළේද යන්න හෙළිදරව් කළ යුතුය. | පිළිගෙන ඇත. |

### 1.3.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී හිඟ වරිපනම් බදු නිසියාකාරව ගණනය කර ගිණුම්ගත නොකිරීම නිසා ගිණුම්වල හිඟ වරිපනම් ශූන්‍ය අගයක් නිරූපණය කෙරිණි. | ප්‍රාදේශීය සභාවේ හිඟ වරිපනම් බදු නිසි අයුරින් ගණනය කර ගිණුම්ගත කළ යුතුය. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2016 සහ 2017 වර්ෂවලට අදාළ හිඟ වරිපනම් බදු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ වරිපනම් ගිණුම්ගත කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඇ) | මුද්දර ගාස්තු නිසි අයුරින් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල මුද්දර ගාස්තු ලෙස හෙළිදරව් කර නොතිබුණි. | මුද්දර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඈ) | මෝටර් රථ වාහනවල වටිනාකම වර්ෂ 05 කට අධික කාලයක සිට ගණනය නොකර හෝ ප්‍රත්‍යාගණනය නොකර මුළු එකතුවක් ලෙස රු.62,315,478 ක් දක්වා තිබුණි. | සභාව සතු මෝටර රථ හා වාහනවල වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දැක්විය යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඉ) | ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම රු.35,936,292 ක එකතුව ලෙස වර්ෂ 10 කට අධික කාලයක සිට ප්‍රත්‍යාගණනයක් නොකර ඉදිරිපත් කර තිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකම ප්‍රත්‍යාගණනයක් සිදුකර ගිණුම්වල ඉදිරිපත් කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදනවලින් මිලදී ගත් පරිගණක කට්ටල සහ ඡායා පිටපත් යන්ත්‍රවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | අදාළ අවශ්‍යතාවයන් සඳහා මිලදී ගත් පරිගණක කට්ටල සහ ඡායා පිටපත් යන්ත්‍රය එම අවශ්‍යතා සඳහා පමණක් භාවිතා කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |

**1.3.4 අසම්භාව්‍ය වගකීම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රාදේශීය සභාව විසින් මේ සඳහා සිදු කළ වියදම් අසම්භාව්‍ය බැරකම් ලෙස ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ අසම්භාව්‍ය බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අඛණ්ඩ පැවැත්මට තර්ජනයක් වන ආකාරයෙන් පවතින සභාවේ මූල්‍ය තත්ත්වය<br>-------------------------------------<br>සභාවේ 2018/2019 මූල්‍ය වර්ෂය සඳහා අතැති මුදල් ශේෂය, බැංකු ශේෂය, තැන්පත් ගිණුමේ ඇස්තමේන්තුව, ආදායම් වියදම් පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී සභාව විශාල මූල්‍ය අර්බුදයකට මුහුණපා ඇති බවත් සභාව තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකිව අතරමැද ඛණ්ඩ කිරීමට සිදුවිය හැකි අවදානම් තත්ත්වයක පවතින බවත් තිබුණි. | සභාවේ අරමුදල් තත්ත්වය සභාව පවත්වාගෙන යා හැකි ආකාරයට අරපිරිමැසුම්දායක ලෙස හා ඵලාදයී ලෙස භාවිතා කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. |

## 1.3.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ගිණුම්<br>----------------------<br>මූල්‍ය ප්‍රකාශනවල හිඟ වරිපනම් බදු රු.11,937,904 ක් අඛණ්ඩව වර්ෂ 10 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවතුණි. එසේ වුවත්, ඒ පිළිබඳ ලියකියවිලි, ලේඛන සහ තහවුරු කළ හැකි සාක්ෂි කිසිවක් නොමැතිව ගිණුම්වල ඉදිරිපත් කරමින් පැවති අතර හිඟ හිටි වටිනාකම් අයකිරීමට හෝ ලෙජර් ගිණුම්වලින් කපා හැරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු ගිණුම්වල ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යා යුතු අතර හිඟ හිටි වටිනාකම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය, සේවය අත්හිට වූ සහ විශ්‍රාම ගිය සේවකයන් 06 දෙනෙකුගේ ණය මුදලින් අයකර ගත යුතු රු.51,626 ක් 1998 වර්ෂයේ සිට හිඟ හිටි වශයෙන් ඉදිරිපත් කර තිබුණි. එසේ වුවත්, එම ශේෂ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටව පවතින ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | පිළිගෙන ඇත. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

---------------------

| | | |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ණය බැරකමක් ලෙස දක්වා තිබූ වියදම් ණයහිමියෝ රු.30,629 ක් වර්ෂ 05 කට අධික කාලයක සිට හඳුනාගෙන එය නිරවුල් කිරීමට හෝ ඒවා කපාහැරීමට කටයුතු කර නොතිබුණි. | වියදම් ණයහිමි ශේෂය අදාළ කාල පරාසය තුළ ගෙවා අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. | පිළිගෙන ඇත. |

**1.3.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම**

**-----------------------------------------------**

**තොරතුරු ඉදිරිපත් කර නොතිබීම**

**----------------------------------------**

පහත දැක්වෙන රු.195,232,508 ක් වටිනා ගිණුම් විෂයයන් 06 ක් ඉදිරියෙන් සඳහන් කර ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස ඒවා සන්නිරීක්ෂණය කළ නොහැකි වීම.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 35,936,292 | ඉඩම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය | සඳහන් කළ ශේෂයන් තහවුරු කිරිම සඳහා ලියකියවිලි, තොග ලේඛන, වත්කම් ලේඛන පවත්වාගෙන යා යුතුය. | පිළිගෙන ඇත. |
| යන්ත්‍රෝපකරණ | 4,242,857 | වත්කම් ලේඛන, අයිතිය තහවුරු කිරීමේ ලේඛන | | |
| මෝටර් රථ හා කරත්ත | 62,315,978 | | | |
| විදුලිය ගබඩා උපකරණවල තොග | 1,099,519 | තොග ලේඛන | | |
| ගබඩා තොගය | 19,690 | තොග ලේඛන | | |
| බැරකම් | 30,629 | ගෙවිය යුතු ලේඛන | | |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව

නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්තිය සහ පළාත් පාලන නිවාස ඉදිකිරීම් හා කර්මාන්ත අමාත්‍යාංශයේ 1988 ජනවාරි 13 දිනැති අංක 488/16 දරන ගැසට් නිවේදනයේ 31(1) උප වගන්තිය | ප්‍රාදේශීය සභාවේ කාර්යයන් ලිහිල් කිරීමේ අරමුණින්, සම්පූර්ණ වූ තීරණ ලබාගැනීමටත් සභාවේ අරමුදල්, ප්‍රතිපත්ති සැලසුම්, නිවාස ඉදිකිරීම්, සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පාරිසරික හා මහජන උපයෝගීතා වැනි කාරණා සඳහා වෙන වෙනම කමිටු ස්ථාපිත කර තිබුණත්, එම කමිටු විගණන දිනට වන 2019 මැයි 10 දින වන විටත් කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ සෑම කටයුත්තක් සඳහාම වෙන වෙනම කමිටු පත් කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති මාලාව X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා තථ්‍ය ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර අයවැය සැලැස්ම සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් අඩංගු ප්‍රකාශයක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම් සහ සිදුකළ වියදම් අයවැය ඇස්තමේන්තුව සමඟ සැසඳීම් කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරගණක උපකරණ හා මෘදුකාංග ලේඛනගත කිරිම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | පරිගණක හා උපාංග සම්බන්ධයෙන් වෙනමම ලේඛනයක් පවත්වාගෙන යා යුතුයි. | පිළිගෙන ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,601,133 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,811,723 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,412,856 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් විෂයය** | **ඇස්තමේන්තුගත ආදායම්** | **ලැයිස්තුගත කළ ආදායම්** | **අයකළ ආදායම්** | **දෙසැම්බර් 31 දිනට හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම්** | **ලැයිස්තුගත කළ ආදායම්** | **අයකළ ආදායම්** | **දෙසැම්බර් 31 දිනට හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,150,000 | 13,550,280 | 1,612,376 | 11,937,904 | 3,675,000 | 13,076,123 | 1,138,219 | 11,937,904 |
| කුලී | 13,588,600 | 6,043,392 | 4,724,363 | 1,329,028 | 17,570,000 | 7,171,629 | 6,636,542 | 532,086 |
| බලපත්‍ර ගාස්තු | 2,835,000 | 3,121,463 | 3,121,463 | - | 2,120,000 | 2,339,146 | 2,335,414 | 3,734 |
| අනෙකුත් ආදායම් | 19,408,000 | 14,234,567 | 12,161,501 | 2,082,066 | 26,572,000 | 19,851,081 | 17,373,514 | 2,477,566 |

#### 2.2.2 ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය

| | **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ කඩ කුලී රු.469,920 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලී අයකිරීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු 2016 වර්ෂයේ ආදායමට අයකර ගෙන තිබුණි. එසේ වුවත්, සභාව විසින් 2017 සහ 2018 වර්ෂ සඳහා ලැබිය යුතු ආදායම් ගිණුම්වල දක්වා නොතිබූ අතර, අදාළ ගැනීමටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ගිණුම්වල දැක්විය යුතු අතර ඒවා අයකර ගැනීමටද ක්‍රියා කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

(ඈ) වරිපනම් බදු

------------------

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින කොට්ඨාශ 11 ක් යටතේ ඇති ගම්මාන 09 ක් සඳහා වරිපනම් බදු අයකිරීම සඳහා වූ ක්‍රියාමාර්ග සභාව විසින් මන්දගාමී අයුරින් සිදුකරනු ලැබේ. | සභාවේ සියළුම කොට්ඨාශවලින් වරිපනම් බදු තක්සේරු කර අයකිරීම සඳහා කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

(ඇ) JCB යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය

----------------------------------

ප්‍රාදේශීය සභාවට රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පරිත්‍යාග ලෙස ලබාදුන් අදාළ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 191.2 ක් භාවිතා කර තිබුණි. මේ අනුව, ඉන්ධන, යන්ත්‍ර අලුත්වැඩියාව, රියදුරු වැටුප් සහ යන්ත්‍රයේ ණය ආපසු ගෙවීම්වල එකතුව රු.747,927 ක් වැය කර තිබුණි. සභාවේ කාර්යයන් හැර අනෙකුත් කාර්යයන් සඳහා මෙම යන්ත්‍රය, යන්ත්‍ර පැය 714.1 ක් භාවිතා කර තිබූ අතර රු.120,625 ක් පමණක් උපයාගෙන තිබුණි. මෙම ක්‍රියාවලිය සමීක්ෂණය කළ විට සභාවට වාර්ෂිකව රු.627,302 ක් ආසන්න වශයෙන් අහිමි විය හැකිය. | JCB යන්ත්‍රය සභාවට ආදායම් උපයා දිය හැකි ආකාරයට නිසියාකාරව කළමනාකරණය කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

(ඉ) Excavator මිලදී ගැනීම

-------------------------------

සභාවේ කටයුතු සඳහා 2017 වර්ෂයේදී රු.මිලියන 11 ක් පමණ වටිනාකම වූ Excavator යන්ත්‍රයක්, සභාවේ අරමුදල් සහ LLDF ණය සැලැස්ම මඟින් රු.මිලියන 8.7 ක් 9% ක පොලියක් මත ලබාගනිමින් වර්ෂ 05 කට මාසිකව රු.181,843 ක් ගෙවිය යුතු කොන්දේසිය මත මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් 2018 වර්ෂයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (i) | 2017 අප්‍රේල් මාසයේ සිට 2019 අප්‍රේල් මාසය දක්වා පොලිය හා වාරික සමඟ එකතුව රු.4,729,918 ක් ගෙවා තිබුණි. මෙහි පොලී වශයෙන් රු.1,430,000 ක් | ණය පදනම මත මිලදී ගෙන තිබූ Excavator යන්ත්‍රය පොලියද ගෙවිය හැකි ආකාරයට ආදායම් | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | ගෙවිය යුතුව තිබුණත්, මේ දක්වා රු.340,000 ක් පමණක් ආදායම් ලෙස උපයාගෙන තිබුණි. එසේම, 2022 මාර්තු මාසය දක්වා තවත් එකතුව රු.6,364,505 ක් පොලියත්, වාරික මුදලක් වශයෙන් මුළු මුදලක් ගෙවිය යුතුව තිබේ. මෙය සමාන වාරික රු.181,843 කින් ගෙවිය යුතුව තිබේ. | උපයන බවට තහවුරු කළ යුතුය. | |
| (ii) | මාසිකව රු.566,000 ක ආදායම් ලබාගත හැකි බව මෙම යෝජිත සැලසුම් වාර්තාවේ සඳහන්ව තිබුණත් මේ දක්වා ලබාගත් ආදායම් අනුව, රු.15,000 ක් පමණක් මාසික ආදායම වී තිබුණි. | අදාළ යන්ත්‍රයේ යෝජිත පරිදි වූ ආදායම් ඉපැයීම තහවුරු කළ යුතු වීම. | පිළිගෙන ඇත. |
| (iii) | මෙම යන්ත්‍රය මිලදී ගත් පරමාර්ථය සඳහා භාවිතා කළ නොහැකි වූ බැවින් සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාර්යය සඳහා පමණක් දැනට භාවිතා කෙරේ. | භාවිතා කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (iv) | විධිමත් අයුරින් සැලසුම් කිරීමකින් තොරව සිදුකළ මෙම මිලදී ගැනීම නිසා, සභාව අලාභ ලබා තිබූ අතර මාසිකව දැරීමට නොහැකි මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වී තිබුණි. | අදාළ යන්ත්‍ර මිලදී ගැනීම පිළිබඳව විධිමත් සැලැස්මක් සැකසිය යුතුව තිබුණි. | පිළිගෙන ඇත. |
| (v) | සභාව විසින් කඩිනමින් සුදුසු වෙනත් පිළියම් ඉක්මනින් ගැනීමට අපොහොසත් වුවහොත් මෙම මිලදී ගැනීම සඳහා වැය කළ සහ වැය කිරීමට ඇති ආසන්න වශයෙන් රු.මිලියන 11 ක මුළු මුදලම නිෂ්ඵල වියදමක් වේ. | සුදුසු වෙනත් පිළියම් කඩිනමින් යෙදීමෙන් සභාවේ අරමුදල් නිෂ්ඵල වීම වළක්වා ගත යුතුය. | පිළිගෙන ඇත. |

### 2.2.4 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.1,639,841ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබූ අතර, ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්වල ඉදිරිපත් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2017 සහ 2018 කාලපරිච්ඡේදයේ නිශ්චල දේපල පැවරීම් මත මුද්දර ගාස්තු මඩකලපුව සහ කල්මුණේහි පිහිටි දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි දෙපාර්තමේන්තුව විසින් එක් රැස් කර, පළාත් භාණ්ඩාගාර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරනු ලැබේ. මෙම මුද්දර ගාස්තු පළාත් පාලන ආයතන ලබාගැනීම පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) නැගෙනහිර පළාත් සභාවේ 2010 වර්ෂයේ අංක 06 දරන මුද්දර ගාස්තු සංශෝධන 03 වගන්තිය අනුව ගාස්තු අයකළ යුතු වුවද, 2018 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර කොමසාරිස් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසයන් ඇතුළත අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාල පරාසය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ii) නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන්, නැගෙනහිර පළාත් පාලන ආයතන 2008 අංක 01 දරන බදු හා ගාස්තු පැනවීම සඳහාත්, රැස්කිරීම සඳහාත් මූල්‍ය පාලන පනතේ 37 වගන්තිය ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ පිහිටි නිශ්චල දේපල පැවරීමේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් 2016, 2017 සහ 2018 දෙසැම්බර් මස දක්වා කාලපරිච්ඡේදය තුළ ඍජුව හා ජංගම සේවාවන් මඟිනුත් අයකරනු ලැබූ අමතර මුද්දර ගාස්තු පිළිබඳව දේපල හිමියන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ මුද්දර ගාස්තු ගණනය කර අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අමතර මුද්දර ගාස්තු සම්බන්ධයෙන් දේපල හිමිකරුවන් විසින් නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවනු ලැබූ මුද්දර ගාස්තු ගණනය කර ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු ආදායමකි. එසේ වුවත්, 2018 වර්ෂයේදී නැගෙනහිර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් අමතරව අයකරනු ලැබූ මුද්දර ගාස්තු රු.363,000 ක් විගණන දිනය වන 2019 මැයි 10 දින වන විටත් ප්‍රාදේශීය සභාවට ලැබී නොතිබුණි. මේ නිසා, අමතර මුද්දර ගාස්තු සහ ඉඩම් විකුණුම් ගාස්තු වැනි ආදායම් වාර්ෂිකව අහිමි වෙමින් පැවතුණි. | ඉඩම් විකුණුම් ගාස්තු ආදායම් වාර්ෂිකව ලබාගැනීම තහවුරු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ ආදායම් සහ විධිමත් කිරීම් සඳහා ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස් කර ක්‍රියාත්මක කර තිබිය යුතුය. එසේ වුවත්, ප්‍රාදේශීය සභාව විසින් 2012 අගෝස්තු 04 දින අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් යෝජනා නැගෙනහිර පළාතේ, පළාත් පාලන අමාත්‍යාංශයට අනුමැතිය සඳහා යවා තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අනුමැතිය ලබා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාවේ අතුරු ව්‍යවස්ථා නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | | |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**(ඇ) ප්‍රතිපාදන සලසා නොතිබීම**

| | | |
|---|---|---|
| මහජනතාවට අවශ්‍ය යැයි හඳුනාගෙන යෝජනා කළ ව්‍යාපෘති තුනක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | මහජනතාවට අවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන සලසා ගත යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**(ඈ) සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | | | |
|---|---|---|---|
| (i) | සන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක කළ යුතුව පැවතුණි. | සන අපද්‍රව්‍ය කළමනාකරණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ii) | සන අපද්‍රව්‍ය කළමනාකරණය මාර්ගයෙන් ආදායම් ඉපැයීමේ මාර්ග යෝජනා කළ යුතුයි. | සභාව විසින් ආදායම් ඉපැයිය හැකි ආකාරයට ව්‍යාපෘති යෝජනා කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (iii) | කසළ කුඩු කර ගත හැකි පැවරුම් ඇඹරුම් යන්ත්‍ර, කෙසෙල් ගස් ලියන යන්ත්‍ර සහ කසළ වෙන්කිරීමේ යන්ත්‍ර ආදිය මිලදී ගෙන භාවිතා කිරීමෙන් ආදායම් ඉපැයිය හැකිය. | ආදායම් වැඩිකළ හැකි ආකාරයට කසළ බැහැර කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**(ඉ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායකයින්ගේ නායකත්වයෙන් 2015 වර්ෂයේ තිරසර සංවර්ධන සම්මේලනයේ තීරණය අනුව සභාව විසින් 2030 වර්ෂයේ ලඟාකරගත යුතු තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ තිරසාර සංවර්ධන සම්මේලනයේ තීරණයන්ට අනුකූලව කටයුතු සිදුකිරීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයේ පවතින ඉඩම් හා ඉදිකළ නිවාස හා ගොඩනැගිලි සඳහන් වුවද, ඒ සඳහා ඝන අපද්‍රව්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගයෙන් ආදායම් ඉපැයීමේ මාර්ග යෝජනා කළ යුතුය. | පිළිගෙන ඇත. |
| (ආ) | බදු පදනම මත දේපල ලබාගත් අයගෙන් ඒ සඳහා ඇප ලබාගෙන නොතිබුණි. | බදු පදනම මත දේපල ලබාගත් අයගෙන් ඒ සඳහා ඇප ලබාගත යුතුය. | පිළිගෙන ඇත. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, තෝරාගත් ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත්, 2017 සහ 2018 වර්ෂවලදී විකුණනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, තෝරාගත් ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත්, 2017 සහ 2018 වර්ෂවලදී විකුණනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිගෙන ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| චංචල හා නිශ්චල දේපල ස්ථාවර වත්කම් ලේඛනවල ලේඛනගත කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | අදාළ ලේඛන පවත්වාගෙන යා යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

### 3.5.2 නඩත්තු හා අලුත්වැඩියා නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් භාවිතා නොකර නිෂ්කාර්යව පවතින වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්ෂ 03 කට අධික කාලයක සිට අලුත්වැඩියා කළ හැකි හෝ අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. මේවා අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුව තිබුණි. | පිළිගෙන ඇත. |
| (ආ) | ප්‍රාදේශීය සභා ගබඩා කාමරයේ විවිධ වත්කම් සහ තොග අයිතමයන් භාවිතයට සුදුසු සහ නුසුදුසු භාණ්ඩ වශයෙන් විවිධ වර්ගයන්ගෙන් වූ භාණ්ඩ පැවතුණි. එසේ වුවත්, ඒවා සලකුණු කර අලුත්වැඩියා කිරීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම භාවිතයට සුදුසු භාණ්ඩ නිසියාකාරව අසුරා ආරක්ෂිත ආකාරයට තැබීමට කටයුතු කර නොතිබුණි. | ගබඩා කාමරයේ භාවිතයට සුදුසු/නුසුදුසු අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි භාණ්ඩ නිසි අයුරින් අසුරා ආරක්ෂිතව තැබීමට කටයුතු කළ යුතුය. | පිළිගෙන ඇත. |

### 3.5.3 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය, ප්‍රාදේශීය සභාව විසින් පත්කරනු ලැබූ තිදෙනෙකුගෙන් යුත් සමීක්ෂණ කමිටුව මඟින් 2019 ජනවාරි 30, 31 සහ පෙබරවාරි 01 දිනයන්හි පවත්වා තිබූ අතර මේ සඳහා ගෙවීම් වශයෙන් රු.6,000 ක් ගෙවා තිබුණි. මෙම සමීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය පැවැත්වීම සඳහා පත්කළ නිලධාරීන් භාණ්ඩවල සත්‍ය තත්ත්වය සනාථ කිරීම වශයෙන් තොග ලේඛනවල සැසඳීම් සිදුකර ගණනය කරනු ලැබූ | තොග ලේඛන සසඳා තක්සේරු කළ බවට හෙළිදරව් කිරීම සඳහා තොග ලේඛන සලකුණු කර, තහවුරු කර අත්සන් තැබිය යුතුය. | පිළිගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| | බවට හෙලිදරව් කිරිම සඳහා තොග ලේඛනවල සලකුණු කර, සනාථ කර අත්සන් තබා නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය 2018 දෙසැම්බර් 31 දින පදනම් කරගෙන සිදුකළ යුතුය. තවද, මෙම දිනට පසුව සිදු වූ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධයෙන් ගැලපීම් සිදුකර අවසන් තොගය ගණනය කළ යුතු වුවත්, මෙම ක්‍රියාවන් සම්බන්ධයෙන් ගණනය කිරීම් පිළිබඳ සැලකිලිමත් නොවී අවසන් තොග සමීක්ෂණය සිදුකර තිබුණි. | අවසාන භාණ්ඩ/ තොග තක්සේරු කළ යුතු වුවත්, මෙම මෙහෙයුම් සම්බන්ධයෙන් තක්සේරු කිරීම් පිලිබඳ අවධානය යොමු නොකර, භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණි. | පිළිගෙන ඇත. |
| (ඇ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණ කමිටුව විසින් සාක්ෂි සනාථ කිරීම් සිදුකළ පොදු 47 ආකෘතියේ “S” වශයෙන් සලකුණු යොදා හඳුන්වා දුන් භාණ්ඩ සම්බන්ධයෙන් විගණන දිනය වන 2019 අප්‍රේල් 30 දින, පරීක්ෂා කිරීමේදී මෙලෙස සලකුණු කර තැබූ භාණ්ඩ සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. | 2019 මැයි 09 දින සමීක්ෂණය සිදු කළ විට මෙලෙස සලකුණු කළ භාණ්ඩ සංඛ්‍යාවේ හිඟයක් දක්නට ලැබුණි. | පිළිගෙන ඇත. |
| (ඇ) | වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩාගාරය සහ විගණන “66” යන ආකෘතියේ භාවිතා කරනු ලබන භාණ්ඩ හෙලිදරව් කළ යුතුය. එසේ වුවත්, මෙම භාණ්ඩ තොග සමීක්ෂණ මණ්ඩලය විසින් ඉහත ආකෘතියේ හෙලිදරව් කළ යුතු භාණ්ඩ සහ පොදු 47 ආකෘතියේ දැක්විය යුතු භාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව සමීක්ෂණය සිදුකර නොතිබුණි. උදා:ලෙස අලුත්වැඩියා කල නොහැකි තත්ත්වයේ දීර්ඝ කාලයක් පළුදු වී තිබූ ඩිජිටල් කැමරා 02 ක් භාවිතයේ පවතින උපකරණ ලෙස සලකා සමීක්ෂණයේ හෙලිදරව් කර තිබුණි. | පොදු 47 ආකෘතියේ දැක්විය යුතු භාණ්ඩ වශයෙන් බෙදා වෙන්කර සමීක්ෂණය සිදුකර නොතිබුණි. උදා:අලුත්වැඩියා කළ නොහැකිව දීර්ඝ කාලයක සිට පවතින උපකරණ ලෙස සලකා භාණ්ඩ සමීක්ෂණයේ හෙලිදරව් කළ යුතුයි. | පිළිගෙන ඇත. |

## 3.6 අරපිරිමැසුම්දායක නොවූ ගනුදෙනු

### 3.6.1 වීථි ලාම්පු මිලදී ගැනීම හා නිකුත් කිරීම

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ තම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි ලාම්පු සවිකිරීම සඳහා රු.457,900 කට විදුලි උපකරණ මිලදී ගෙන තිබුණි. මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාර්ගවල වීථි විදුලි ලාම්පු සවිකිරීමේ අවශ්‍යතාවයන් සඳහා මහජනතාවගෙන් පැමිණිලි සහ ඉල්ලීම් අවම වශයෙන් ලැබී තිබූ නමුත්, සභාවේ වීථි ලාම්පු මිලදී ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. මහජනතාව විසින් සිදුකළ ඉල්ලීම්වලට අනුකූලව මෙම මිලදී ගැනීම් සිදු කළ යුතුය. | මහජනතාව විසින් සිදුකළ ඉල්ලීම්වලට අනුකූලව මෙම මිලදී ගැනීම් සිදු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ආ) | මාර්ගවල සවිකරනු ලබන 100 LED, 100 Street Light විදුලි බල්බ සෑම එකක්ම රු.1,450 බැගින් වූ මිලකට මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, මඩකලපුව මහනගර සභාව සහ අනෙකුත් ප්‍රාදේශීය සභා සමඟ සැසඳීමේදී තම ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගනු ලබන විදුලි බල්බවල බලශක්තිය සහ මිල ඉහළ අගයක් වී තිබුණි. | මඩකලපුව මහනගර සභාව සහ අනෙකුත් ප්‍රාදේශීය සභා සමඟ සැසඳීමේදී තම ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගනු ලබන විදුලි බල්බවල බලශක්තිය සහ මිල ඉහළ අගයක් වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ඇ) | මාර්ග සඳහා විදුලි බල්බ මිලදී ගැනීම සඳහා සභාව විසින් සෑම වර්ෂයකම අයවැය ඇස්තමේන්තුව මඟින් සලසනු ලබන ප්‍රතිපාදන උපයෝජනය කරනු ලබයි. එසේම, සමාලෝචිත වර්ෂයේ සභාවේ සභාපතිවරයා සහ සභිකයන්ගේ පෞද්ගලික කැමැත්ත පදනම් කරගනිමින් මෙම මිලදී ගැනීම් සිදුකර සවිකර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ සභාවේ සභාපතිවරයා සහ සභිකයන්ගේ පෞද්ගලික කැමැත්ත පදනම් කරගනිමින් මෙම මිලදී ගැනීම් සිදුකර සවිකර යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

## 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සභාව විසින් සැපයුම් හා සේවාවන් සඳහා සකස් කර තිබිය යුතුය. එසේ වුවත්, සභාව විසින් සැපයුම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණු අතර, සේවාවක් සඳහා සභාව විසින් සකස් කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම සඳහා මූලික පදනම් ලියවිල්ල, යෝජනා, පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන වැඩසටහන්වල යෝජිත සේවාවන් අනුගමනය නොකර මෙම සැලැස්ම සකස් කර තිබුණි. | පළාත් පාලන ආයතනවල වර්ෂ 04 ක සංවර්ධන වැඩසටහන්වල යෝජිත සේවාවන් අනුගමනය කරමින් සැලැස්ම සකස් කළ යුතුයි. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

### 3.7.2 සැපයුම් හා සේවාවන්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙවන පෙළ සෞඛ්‍ය වැඩසටහන යටතේ කසල බඳුන් එකතු කිරීමේ බඳුන් සහ නැවත භාවිතා කළ හැකි කසළ එකතු කිරීමේ මළු, රාජ්‍ය ආයතන සහ මහජනතාවට බෙදාහැරීමේ පරමාර්ථයෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. එසේ වුවත්, සභාව විසින් රු.143,928 කට කසළ රැස්කිරීමේ ප්ලාස්ටික් බඳුන් 200 ක් පමණක් මිලදී ගෙන රාජ්‍ය ආයතනවලට පමණක් ලබා දී තිබුණි. | කසළ රැස්කිරීමේ ප්ලාස්ටික් බඳුන් 200 ක් පමණක් මිලදී ගෙන රාජ්‍ය ආයතනවලට පමණක් නොව මහජනතාවටද ලබා දිය යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වී නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුය. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විධිමත්ව සැලසුම් කර අභ්‍යන්තර විගණන කටයුතුවලට අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. | මෙම වර්ෂයේ පළමු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2019 මැයි 02 දින පැවැත් වූ බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. | චක්‍රලේඛ හා පනතේ විධිවිධානවලට අනුව ක්‍රියාකළ යුතුවීම. | ඉදිරියේදී මෙවැනි දෝෂ නොවන අයුරින් නිවැරදි කිරීම් සිදු කෙරේ. |
| (ආ) | අයවැය පාලනය | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂවල තථ්‍ය වියදම් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අයවැය පිළියෙල කිරීමේදී පසුගිය කාලයේ තථ්‍ය වියදම් සැලකිල්ලට ගත යුතු වේ. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | | (ii) | සභාවේ භාවිතා නොකර නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් භාවිතා කිරීමටපියවර ගැනීම. |